**පළාත් මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා**
**බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය**

## මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

# කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම්

# මාර්ග ඉදිකිරීම් සඳහා වන මධ්‍යම පළාතේ ප්‍රමුඛතම ආයතනය සමග එක්වන්න අවස්ථාවක්

මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා **කොන්ත්‍රාත් පදනම මත** රියදුරු තනතුර සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

## රියදුරු - තනතුරු 18 (කොන්ත්‍රාත් පදනම් මත)

- මාසික වැටුප

ප්‍රාථමික ශිල්පීය (PL3) සේවා බාණ්ඩයට අදාළව කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2025 අනුව

- ➢ උපලේඛන I අනුව හිමි වැටුප - රු. 43,280.00
- ➢ උපලේඛන II අනුව ගෙවන වැටුප - රු. 40,834.00

- **සුදුසුකම්**

**අධ්‍යාපන සුදුසුකම්**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙක (02) ක් සහිතව විෂයයන් හය(06)කින් සමත් වීම.

**ප්‍රවීණතා :-**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු රිය පැදවීම් සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

**පොදු කොන්දේසි**

- ❍ අයදුම්කරුවන් බඳවා ගන්නා දිනට අදළ සුදුසුකම් සියලු ආකාරයෙන් සම්පූර්ණ කර තිබිය යුතුය.
- ❍ බඳවා ගන්නා දිනට වයස අවුරුදු 45ට වඩා අඩුවිය යුතුය. දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ අර්ධ රාජ්‍ය පූර්ව රාජ්‍ය ආයතනයක (සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක) සේවයේ නියුක්ත අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බල නොපානු ඇත.
- ❍ රාජ්‍ය සේවා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත අදළ දෙපාර්තමේන්තු/ සංස්ථා/ මණ්ඩල ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය.
- ❍ අයදුම්කරුවන් විසින් තමාගේ ජීව දත්ත අඩංගු අයදුම්පත සකස්කර එවිය යුතු අතර තමා පිළිබඳ තොරතුරු ලබා ගත හැකි දෙදෙනෙකුගේ නම් සඳහන් කර එවිය යුතුය.
- ❍ ඔබ විසින් යොමු කරනු ලබන අයදුම්පත්‍රයේ සඳහන්ව ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් ලබා දුන් බවට බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.
- ❍ මෙම තනතුර හුදෙක් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා අතර අධිකාරියේ අභිමතය පරිදි කොන්ත්‍රාත් සේවා කාලය දීර්ඝ කිරීම හෝ නොකිරීම සිදුකළ හැකිය.
- ❍ තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- ❍ අදළ ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.
- ❍ මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ට ප්‍රමුඛතාවයක් ලබා දෙනු ලැබේ.

**බඳවා ගන්නා ක්‍රමය ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයකින්**

ඉහත සුදුසුකම් ඇතුළත් කර අයදුම්කරුවන් විසින් සකස් කර ගන්නා ජීව දත්ත විස්තර ලේඛනයක් 2026.01.21 වැනි දිනට පෙර සාමාන්‍යාධිකාරී, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, අංක 09, ඇහැලේපොළ කුමාරිහාමි මාවත, බෝගම්බර, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුරු නාමය සඳහන් කළ යුතුය.

**සාමාන්‍යාධිකාරී,**
**පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත.**
**දුරකථන අංකය - 081-2204378**